*සැ. යු.* - 2015.01.02 වැනි දින පළ වූ අංක 1896 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,897 - 2015 ජනවාරි මස 09 වැනි සිකුරාදා - 2015.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 18 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 18 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජනවාරි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

17 – B 080908—302 (2015/01)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 07

MOD/DEF/03/02/VNF/PRO.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2014 අගෝස්තු මස 1 වැනි දින සිට කපිතාන් (ස්වේනාහ) වශයෙන් :

කොමාණ්ඩර් (ස්වේනාහ) [(තාවකාලික කපිතාන් (ස්වේනාහ)] දොන් ලාල් ටයිටස් කන්නන්ගර, ශ්‍රීලංස්වේනාහ - එන්වීඑක්ස් 5082

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

01-335/2

2015 අංක 08

MOD/DEF/03/02/VNF/PRO.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2014 අගෝස්තු මස 1 වැනි දින සිට කොමාණ්ඩර්(ස්වේනාහ) වශයෙන් :

ලුතිනන් කොමාණ්ඩර් (ස්වේනාහ) [(තාවකාලික කොමාණ්ඩර් (ස්වේනාහ)] මොහොට්ටිගේ කපුරුහාමිගේ සුනිල් සෙනෙවිරත්න, ශ්‍රීලංස්වේනාහ - එන්වීඑක්ස් 5192

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

01-335/1

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පිළියන්දල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

චමින්ද කුෂන් වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 දෙසැම්බර් මස 12 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරී විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2011 දෙසැම්බර් මස 20 වැනි දින සහතික කළ අංක 1457 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම චමින්ද කුෂන් වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑපන්ලක්ෂ හතලිස්දහස් පන්සිය හතලිස්හතරයි ශත දහතුනක (රු. 75,40,544.13) ක මුදලක් 2014 ඔක්තෝබර් 31 වැනි දින විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 75,40,544.13ක මුදල අයකර ගැනීම සඳහා 2014 නොවැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1457 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ ගංගොඩවිල ග්‍රාමයේ පිහිටි වනාත පාරේ වරිපනම් අංක 40/1 දරන මිල්ලගහවත්ත හෙවත් මහවත්ත සහ කැටකෑලගහවත්ත හෙවත් මහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එම්. සුනිල් විසින් පිළියෙල කරන ලද 2011 මාර්තු මස 08 වැනි දින අංක 1656 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වනාත පාරේ වරිපනම් අංක 36ත් ද, නැගෙනහිරට : වනාත පාරෙන් ද, දකුණට : වනාත පාරේ වරිපනම් අංක 44ත් ද, සහ බස්නාහිරට : 3 වන පටුමගේ වරිපනම් අංක 16ත් ද මායිම් වූ එකී අංක 1656 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ. 0. රූ. 0, පර්. 20)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

01-328/1

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පානදුර ශාඛාව

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය**

ප්‍රියන්ත ට්‍රේඩින් එජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 දෙසැම්බර් මස 12 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2011 නොවැම්බර් මස 14 වැනි දින සහතික කළ අංක 3687 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ප්‍රියන්ත ට්‍රේඩින් එජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටහයලක්ෂ දහඅටදහස් අනූනමයයි ශත හතලිස්හතර (රු. 66,18,099.44) ක මුදලක් 2014 නොවැම්බර් 10 වැනි දින විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 66,18,099.44ක මුදල අයකර ගැනීම සඳහා 2014 නොවැම්බර් මස 11 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3687 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර-තල්පිටි දෙබැද්දේ පානදුර නගර සභා සීමාව තුළ පානදුර පට්ටියේ පිහිටි අරඹදාදෙණියවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සී. ජී. ප්‍රනාන්දු විසින් 2000 සැප්තැම්බර් මස 25 සහ 28 දින මැන සාදන ලද අංක 2706 දරන පිඹුරේ ලොට් බී1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බලයලත් මිනින්දෝරු බී. වී. එස්. ප්‍රනාන්දු විසින් 2000 මාර්තු 09 දින මැන සාදන ලද අංක 796 දරන පිඹුරේ ලොට් ඒ සහ සී ද, නැගෙනහිරට : ප්‍රධාන පාරෙන් ද, දකුණට : අංක 2706 දරන පිඹුරේ ලොට් බී2 සහ ශ්‍රී ලංකා ටෙලිකොම් (පුද්ගලික) සමාගමට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : මාදන්ගහඕවිට සහ බම්බිගහඕවිට නොහොත් බක්මීගහවත්තෙන් ද මායිම් වූ එකී අංක 2706 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහනමයයි දශම බිංදුවයි නමය (අ. 0, රූ. 0, පර්. 19.09) ක විශාලත්වයෙන් වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 508/22 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

01-328/2

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

**සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව**

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014 ක් වූ නොවැම්බර් මස 14 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී, කහඳව (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2011.12.30 දින අංක 65 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, පිළිමතලාව දරන ස්ථානයේ පදිංචි කාරියවසම් මජුවාන ගමගේ වසන්ත ලාල් සේනාධීර (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තවද වර්ෂ 2014 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් එක්කෝටි පනස් හත් ලක්ෂ පනස් හය දහස් තුන්සිය හැත්තෑ හත (රු. 1,57,56,377.00) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී රුපියල් එක්කෝටි පනස් හත් ලක්ෂ පනස් හය දහස් තුන්සිය හැත්තෑ හත (රු. 1,57,56,377) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි හතලිස් දෙලක්ෂ අසූ පන් දහස් හත්සිය විස්ස (රු. 1,42,85,720) ක මුළු මුදලක් මත සාමාන්‍ය බර තැබූ මූලික ණය දෙන අනුපාතිකය (AWPLR) සමඟ වසරකට සියයට හතක (7%) ක පොළිය ද වන අතර මෙය සෑම තුන් මසකට වරක්ම සකසන අතර 2014 දෙසැම්බර් මස 01 වැනි දින දක්වා කාල සීමාවට අදාළ පොළී අනුපාතිකය සියයට දාහතරයි දශම දෙකයි එකක් (14.21%) වන අතර ඒ සමග ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රයන් ඇතුළුව නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු වූ පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල වලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මඩපලාත කෝරළේ, පිළිමතලාවේ පිහිටි අස්වැද්දුම යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. බී. ලංසාකාරනායක විසින් මැන සාදන ලද වර්ෂ 2011.12.04 දින අංක 7518 දරන පිඹුරු පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 1 දරන බිම් කොටසට මායිම්, එනම් උතුරට : නානු ඔයෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 432හි ලොට් අංක 1න් ද, දකුණට : කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයෙන් සහ බස්නාහිරට : පිඹුරු අංක 432හි ලොට් අංක 3 ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොලහ (අ. 0, රූ. 0, පර්. 12) ක ඉඩම සමග ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ එයට අදාල සියළු දේද වේ.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩම නැවත මැනීමක් වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මඩපලාත කෝරළේ, පිළිමතලාවේ පිහිටි අස්වැද්දුම යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. බී. ලංසාකාරනායක විසින් මැන සාදන ලද වර්ෂ 1992.01.15 දින අංක 432 දරන පිඹුරු පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 2 දරන බිම් කොටසට මායිම්, එනම් උතුරට : නානු ඔයෙන් ද, නැගෙනහිරට : එම පිඹුරේම ලොට් අංක 1න් ද, දකුණට : කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයෙන් සහ බස්නාහිරට : පිඹුරු අංක එම පිඹුරේම ලොට් අංක 3 ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහ (අ. 0, රූ. 0, පර්. 12) ක ඉඩම සමග ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ එයට අදාල සියළු දේද වේ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඉඩමේ සහ පරිශ්‍රයේ දැනට සහ මින් මතුවට ස්ථිරවම සවි වී හෝ සවිකර හෝ සම්බන්ධකර ඇති සෑම සහ සියළුම නිශ්චල යන්ත්‍ර සූත්‍ර උපකරණ ඇමුණුම් ද ඇතුළුව එයට පමණක් සීමා නොවී විදුලිය සැපයීමේ පද්ධතිය ද, ජලය සැපයීමේ පද්ධතිය සහ විදුලි සංදේශ පද්ධතිය ද වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

01-221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.